# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,922 - 2015 ජූලි මස 03 වැනි සිකුරාදා - 2015.07.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — | පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 996 | අයවැය ලේඛන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — | දේපළ විකිණීම් ... ... ... | — |
| | | විවිධ දැන්වීම් ... ... ... | 998 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජූලි මස 24 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජූලි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් පාලන නිවේදන

## බලපිටිය ප්‍රාදේශීය සභාව

### වීථි නම් කිරීමේ නිවේදනය

බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් මාර්ග උපලේඛනයේ සඳහන් යෝජිත නාමය යටතේ නම් කිරීම සඳහා බලපිටිය ප්‍රාදේශීය සභාව විසින් අංක 44 හා 2013.12.17 දිනැති මහා සභාවේ දී යෝජනා සම්මත කරන ලදුව 1997 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වන වගන්තිය ප්‍රකාරව දකුණු පළාත් ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් දපපා/ප්‍ර අ/පපා/02/05/න.ප්‍ර./01 හා 2014.10.14 දිනැති ලිපිය මගින් අනුමැතිය ලබා දී ඇත.

මින් ඉදිරියට උපලේඛනයේ සඳහන් මාර්ගයන් යෝජිත නාමයෙන් හැඳින්වීමට කටයුතු කරන බව මහජනතාවට මින් නිවේදනය කරමි.

**උපලේඛනය**

| | *මාර්ගය* | *යෝජිත නාමය* |
|---|---|---|
| 1. | අංක 88 රන්දෙඹේ දකුණ ග්‍රාම නිලධාරී වසමේ මැදගොඩ පාරේ අතුරු මාර්ගය | පී. ධර්මසේන මාවත |
| 2. | අහුන්ගල්ල වැලිකන්ද ශ්‍රී සුමංගල මාවතේ දුම්රිය පාර පසු කර මුලට දකුණු දෙසට නාන ළිඳ අසළින් ආරම්භ වන මාර්ගය | පූජ්‍ය කහටපිටියේ පඤ්ඤාසේන නාහිමි මාවත |

ඒ. එච්. ආර්. ලසන්ත,
ලේකම්,
බලපිටිය ප්‍රාදේශීය සභාව.

2015 ජූනි මස 10 වැනි දින දී ය.

07-137

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

### ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) වගන්තිය යටතේ කරනු ලබන දන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාරව, බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට මහ නගර සභාව විසින් මැන සළකුණු යොද ඇති මෙම මංමාවත සම්බන්ධයෙන් අදළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයක් විසින් විරුද්ධතාවයක් පල කරන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මසක් ඇතුළත එකී විරෝධතාවයන් ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2015 ජූනි මස 18 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

| *අනු. අංකය* | *පාරේ නම* | *මායිම් සීමාව සිට දක්වා* | *දිග* | *පළල* |
|---|---|---|---|---|
| 01 | නුගේගොඩ දේවාල පාරේ සිට ස්ටැන්ලි තිලකරත්න මාවත (කෝට්ටේ පාර) දක්වා දිවෙන මාර්ගය | ව.අං. 38බී,38/1,38/2,38/3,38/5 දක්වා<br>ව.අං. 231,231/1,233,231/2,233/2 | අඩි 192<br>153 | 15 සිට 20 දක්වා<br>අඩි 15 |

07-200

## ඇල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ 24(3) උපවගන්තිය අනුව ග්‍රාමීය මාර්ග ලියාපදිංචිය ප්‍රකාශයට පත් කිරීම

පහත උපලේඛනයේ සඳහන් මාර්ගයන් 24(2) වගන්තිය අනුව 2015.03.06 දින *ගැසට් නිවේදනය* මගින් ප්‍රකාශයට පත් කර ඇති අතර, එම මාර්ග සම්බන්ධව යම් විරෝධතාවයක් හෝ නඩු පැවරීමක් මෙතෙක් සිදුවී නොමැති බැවින් 24(3) උපවගන්තිය අනුව පහත මාර්ග ඇල්ල ප්‍රාදේශීය සභාව සතු මාර්ග බව මෙයින් දන්වා සිටනු ලැබේ.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය සභාව විසින් 2015.05.11 දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී සභා සම්මත කරන ලද යෝජනාව අනුව ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් මංමාවත් අදළ ඉඩම් හිමියන් විසින් සභාව වෙත ලබා දෙන ලද ලිඛිත කැමැත්ත අනුව එකිනෙක ඉදිරියේ ඇති දිග පළල අනුව සභාව සතු වන බව මෙයින් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

ප්‍රදේශවාසී ජනතාව මෙම පාරවල් පළල් කිරීමට විරුද්ධ වන්නේ නම් කිනම් කරුණක් නිසා ද යන්න සඳහන් කළ ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 30ක් ඇතුළත මා වෙත එවීමට බලය තිබෙන බවත්, එකී කාලය තුළ යම් විරෝධතාවයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ප්‍රාදේශීය සභාව සතු දේපළක් හැටියට සළකා එකිනෙක ඉදිරියෙන් ඇති දිග පළල අනුව පාලනය කරනු ලබන බවටත් ප්‍රසිද්ධියට පත් කරනු ලැබේ.

පී. එස්. ගාමිණී පතිරන,
ලේකම්,
ඇල්ල ප්‍රාදේශීය සභාව.

2015 ජුනි මස 15 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### ඇල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තුළ පිහිටි මාර්ගවල විස්තරය

| | *මාර්ග විස්තරය* | *දිග (කි. මී.)* | *පළල (අඩි)* |
|---|---|---|---|
| 1. | බදුල්ල පාර - ඉලුක්ගොඩවත්ත | 2 | 8 |
| 2. | කුඹල්වෙල - කොට්ටගස්වත්ත පාර | 1.5 | 9 |
| 3. | බදුල්ල පාර - කුඹල්වෙල - දඹගොල්ල පාර | 3 | 10 |
| 4. | මිල්ලගම - බැද්දේඅරාව පාර | 2.5 | 10 |
| 5. | පියරප්පන්දෝව වෙල්සි ෆැක්ට්‍රිය පාර | 2.5 | 9 |
| 6. | පියරප්පන්දෝව වතුගොවැල්ල පාර | 1/2 | 8 |
| 7. | බදුල්ල බණ්ඩාරවෙල පාර දෙහිගොල්ල | 1 | 9 |
| 8. | යායවත්ත - ගෙදරඅරාව | 1/2 | 8 |
| 9. | හීල්ඔය සුමංගල මාවත | 1/2 | 8 |
| 10. | දඹඅතුගොඩ පාර කිතල් ඇල්ල - හීල්ඔය | 1 | 9 |
| 11. | කිතල්ඇල්ල ගුරුගල්මණ්ඩිය පාර | 1/2 | 9 |
| 12. | කිතල් ඇල්ල - - අගුරුකොටුව පාර | 1/2 | 8 |
| 13. | ඉඩමේගම කොස්වත්ත පාර | 1 | 9 |
| 14. | ඉඩමේ ගම - වදඅඹගහ අසල | 1/2 | 9 |
| 15. | ගොටුවෙල යහල්ලේකුඹුර | 1/2 | 10 |
| 16. | තිබ්බටුගොඩ පාර | 1/2 | 9 |
| 17. | දෙමෝදර - ක්‍රීඩාපිටිය නාවුල්ල | 1/2 | 8 |
| 18. | ගල්ටැංගේන - අඹගස්තැන්න | 1/2 | 9 |
| 19. | සවුදම් වත්ත - නාවෙල ගම විහාරස්ථානය | 2 | 10 |
| 20. | බැද්දේ වල - පුපුල | 3 | 10 |
| 21. | වැල්ලවාය පාර - ගොන්නිනගම | 1 | 9 |
| 22. | කරඳගොල්ල - පහලඇල්ල | 1 1/2 | 10 |
| 23. | හල්පේ - දිඹුල්ගස්තැන්න | 2 | 10 |

07-203

F4 - B 080962

# විවිධ දැන්වීම්

## ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

2015 වර්ෂය සඳහා රථ ගාල් ගාස්තු පැනවීම

ඇල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් 2015 අප්‍රේල් මස 07 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 07.10 යටතේ පහත දක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමිල කර්ෂණ කාරියවසම්,
සභාපති,
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව.

### යෝජනාව

2013.05.17 දිනැති අංක 1811 දරන ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* සඳහන් xxi වැනි කොටස දරන වාහන නතර කිරීම හා වාහන හැසිරවීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවට අනුව ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන වාහන රථ ගාල් සඳහා දෛනික පදනම මත එමෙන්ම එක් අවස්ථාවක් සඳහා නවතා තැබිය හැකි උපරිම කාල සීමාව පැය 6කට සීමා කොට රථ වාහන නවතා තැබීම වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු පනවා අයකර ගැනීම සුදුසු බවටත් ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇල්පිටිය ප්‍රාදේශීය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ත්‍රී රෝද රථ ගාල් සඳහා ගාල් කරන ලද ත්‍රිරෝද රථයක් වෙනුවෙන් 2015 වර්ෂයට අදාළව රු. 250ක වාර්ෂික ගාස්තුවක් අය කර ගැනීම සුදුසු බවටත් ඇල්පිටිය ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

| | | *රු.* |
|---|---|---|
| බස් රථයක් සඳහා | - | 100 |
| ලොරි රථයක් සඳහා | - | 100 |
| වෑන් රථයක් සඳහා | - | 50 |
| කාර් රථයක් සඳහා | - | 50 |
| ත්‍රිරෝද රථයක් සඳහා | - | 30 |
| මෝටර් සයිකලයක් සඳහා | - | 10 |

07-45

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු. ශ.* |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ *ගැසට් පිටුවකින්* අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට් පිටුවකට* ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| **ජූලි** | 2015.07.03 | සිකුරාදා | 2015.06.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.10 | සිකුරාදා | 2015.06.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.17 | සිකුරාදා | 2015.07.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.24 | සිකුරාදා | 2015.07.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.07.30 | බ්‍රහස්පතින්දා | 2015.07.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2015.08.07 | සිකුරාදා | 2015.07.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.14 | සිකුරාදා | 2015.07.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2015.08.21 | සිකුරාදා | 2015.08.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.08.28 | සිකුරාදා | 2015.08.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2015.09.04 | සිකුරාදා | 2015.08.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.11 | සිකුරාදා | 2015.08.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.18 | සිකුරාදා | 2015.09.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.09.25 | සිකුරාදා | 2015.09.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.